යුඤ්ජථ බුද්ධසාසනෙ!

# සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය

## 104 වන සංවත්සරය
## සහ
## 95 වන වාර්ෂික මහා සභා රැස්වීම

**2023 නොවැම්බර් මස 18 වන සෙනසුරාදා**
**සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ**
**ඩී.එච්.විලියම් ශාලාවේදී.**

380, බෞද්ධාලෝක මාවත කොළඹ 07.

# ආරාධනාවයි!

## වාර්ෂික මහා සභා රැස්වීම

## බලාත්මක ව්‍යවස්ථාවේ 13 (1) (අ) ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

1955 අංක 24 දරන ආඥාපණතින් නීතිගත සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ බලාත්මක ව්‍යවස්ථාවේ අංක 13 හි අංක 13 (1) (අ) ඡේදයට යටත්ව 104 වන සංවත්සරය සහ 95 වන වාර්ෂික මහා සභා රැස්වීම **ශ්‍රී බු.ව. 2567 ඉල් මස 18 වන ශනි දින හෙවත් 2023 නොවැම්බර් මස 18 වන සෙනසුරාදා දින පෙ. ව. 08.50 ට** කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ අංක 380 දරන තැන පිහිටි සම්මේලන මූලස්ථානයේදී ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන බව සියළු සාමාජික භවතුන් වෙත ශාසනාලයෙන් දැනුම් දෙන අතර, මේ අවස්ථාවට සහභාගි වන මෙන් කාරුණිකව ඇරයුම් කරමු.

මෙයට - ශාසනාලයැති,

තුෂාර දිලුම් වාහලතන්ත්‍රී     ඉෂාන් බුද්ධික එදිරිසූරිය
ගරු සමලේකම්වරු

# 104 වන සංවත්සර සභාවේ න්‍යාය පත්‍රය

| | |
|---|---|
| පෙ.ව. 8.50 | සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා ප්‍රමුඛ ආරාධිත අමුත්තන් විසින් ජාතික කොඩිය, බෞද්ධ කොඩිය සහ සම්මේලනයේ කොඩිය එසවීම. |
| පෙ.ව. 8.55 | ආරාධිත අමුත්තන් සහ සම්මේලනයේ නිලධාරි මණ්ඩලය සාමාජික භවතුන් සමඟින් ශාලාවට ප්‍රවිෂ්ට වීම. |
| පෙ.ව. 9.00 | ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා විසින් ස්‍යාමෝපාලී වංශික මහානිකායේ මල්වතු මහා විහාර පාර්ශ්වයේ අනුනායක සාහිත්‍ය චක්‍රවර්ති ආචාර්ය අතිපූජ්‍ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ඛිත විජිතසිරි අභිධාන අනුනායක ස්වාමීන්වහන්සේ වෙත මූලාසනය පිළිගැන්වීම. |
| පෙ.ව. 9.05 | පංච ශීලය සමාදන්වීම |
| පෙ.ව. 9.10 | චිරාගත සාම්ප්‍රදානුකූලව පොල්තෙල් පහන් දැල්වීම |
| පෙ.ව. 9.15 | ශාසන විරුවන් සැමරීමේ ගීතය |
| පෙ.ව. 9.25 | සංවත්සර සභාව පිළිගැනීම -<br>සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා |
| පෙ.ව. 9.35 | ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම සහ එම ප්‍රගතිය විදහා දැක්වෙන වීඩියෝපට දර්ශනය |
| පෙ.ව. 9.45 | මූලාසනයේ අනුශාසනාව |
| පෙ.ව. 10.00 | විශේෂ දේශනය<br>සම්මානිත ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිමල් ද සිල්වා මහතා |
| පෙ.ව. 10.30 | තේ පැන් සංග්‍රහය |

# 95 වන වාර්ෂික මහා සභාවේ න්‍යාය පත්‍රය

| | |
|---|---|
| පෙ.ව. 11.00 | සම්මේලනයේ ගරු සභාපතිතුමා මුලසුන ගැනීම |
| පෙ.ව. 11.05 | බොදු සමුළු ගීතය |
| පෙ.ව. 11.15 | වාර්ෂික මහා සභාව පිළිගැනීම<br>ගරු සභාපති චන්ද්‍ර නිමල් වාකිෂ්ඨ මැතිතුමා |
| පෙ.ව. 11.25 | පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කිරීම සහ සභා සම්මත කිරීම |
| පෙ.ව. 11.30 | විගණනය කරන ලද 2020, 2021, 2022 වාර්ෂික ගිණුම් වාර්තා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම |
| පෙ.ව. 11.45 | ඉදිරි වර්ෂය සඳහා විගණකවරුන් පත් කිරීම |
| පෙ.ව. 11.50 | සම්මාන සාමාජිකත්වය පිරිනැමීම |
| ප.ව. 12.00 | විධායක මණ්ඩලය විසින් අනුමත කර ඇති ව්‍යවස්ථා සංශෝධන යෝජනා සහ වෙනත් යෝජනා ඉදිරිපත් කිරීම |
| ප.ව. 12.30 | ශාඛා/සාමාජික සමිති නියෝජිත භවතුන්ගේ සහ සාමාජික භවතුන්ගේ අදහස් දැක්වීම |
| ප.ව. 2.00 | ස්තුති කථාව |
| ප.ව. 2.05 | පුණ්‍යානුමෝදනාව සහ මෛත්‍රී භාවනාවේ යෙදීම |
| ප.ව. 2.10 | ජාතික ගීය ගායනා කිරීම |
| ප.ව. 2.15 | සමාප්තිය |

## ව්‍යවස්ථාවේ අංක 16(1) හා (2) පරිදි 2023.10.14 වෙනි දින විධායක මණ්ඩලය විසින් අනුමත කර ඇති යෝජනා

**යෝජනා අංක 01.**
7. (6) ''විහාරස්ථාන දායක සහා සාමාජිකයෝ'' යනුවෙන් නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

**යෝජනා අංක 02.**
8 (2) වගන්තිය ඉවත් කර මෙසේ සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

8 (2) (අ) යාවජීව සාමාජිකත්වය

''බෞද්ධ සම්මේලනයේ පරමාර්ථ පිළිගනිමින් ව්‍යවස්ථානුකූලව කටයුතු කිරීමට එකඟ වන අවුරුදු 18 ට නොඅඩු බෞද්ධ ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම වසර 03 සාමාන්‍ය සාමාජිකත්වය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ යාවජීව සාමාජිකත්වය ලබා ගත හැකිය.''

**යෝජනා අංක 03.**
8 (2) වගන්තිය 8 (2) (අ) ලෙස සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

**යෝජනා අංක 04.**
8 (2) (ආ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

8 (2) (ආ) සාමාන්‍ය සාමාජික කාලසීමාව තුළ ඔහුට හෝ ඇයට සම්මේලනයේ ජාතික මණ්ඩලයක (විධායක සභාව නියෝජනය නොකරන) හෝ සම්මේලනය මගින් පාලනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ පුරවැසි නිවාසයක හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක පාලක මණ්ඩලයක හෝ සම්මේලනයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය මගින් පත් කරන විශේෂ කමිටුවක සාමාජිකයෙකු වශයෙන් කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතිය ඇතුව කටයුතු කළ හැකිය.

**යෝජනා අංක 05**
8 (4) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

8 (4) විහාරස්ථාන දායක සහා සාමාජිකත්වය, සම්මේලනයේ අවස්ථා නියෝජනය කිරිම සඳහා එක් නියෝජිතයෙකු වාර්ෂිකව නම් කළයුතු අතර ඔහුට හෝ ඇයට කිසිදු ඡන්ද හිමිකමක් හෝ සම්මේලනයේ නිලයකට පත්වීමේ හිමිකමක් නොමැත.

**<u>යෝජනා අංක 06</u>**
9 (2) වගන්තිය 9 (2) (අ) වශයෙන් සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

**<u>යෝජනා අංක 07</u>**
9 (2) (ආ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

9 (2) (ආ) අදාල කමිටුව විසින් සාමාජිකයන් නිර්දේශ කිරීමට අදාල නීතිරීති මාලාවක් තත් කාලයට ගැලපෙන අයුරින් සකස් කර කෘත්‍යාධිකාරී මණ්ඩලයේ නිර්දේශයෙන් විධායක මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර සම්මත කර ගතයුතුය.

**<u>යෝජනා අංක 08</u>**
10 (1) වගන්තිය ඉවත් කර 10 (1) (අ) වශයෙන් සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

10 (1) (අ) යාවජීව සාමාජිකත්වය ලබා ගැනීම සඳහා වර්ෂයකට රු. 1000 බැගින් අඛන්ඩව වර්ෂ 3 ක් සාමාජික මුදල් ගෙවා සාමාන්‍ය සාමාජිකත්වය අලුත් කර ගත යුතුය.

**<u>යෝජනා අංක 09</u>**
10 (1) (ආ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

10 (1) (ආ) නියමිත සාමාජික මුදල් ගෙවා වර්ෂ 03 ක සාමාන්‍ය සාමාජිකත්ව කාලය සම්පූර්ණ කර මාස 03 ක කාලය ඉක්මයාමට මත්තෙන් රු.2500/= මුදලක් ගෙවා යාවජීව සාමාජිකත්වයට ඇතුළත්වීම සඳහා ඉල්ලීමක් කළයුතුය.

10 (1) (ඇ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

10 (1) (ඇ) එසේ යාවජීව සාමාජිකත්වය අවශ්‍ය නොවන්නේ නම් සාමාන්‍ය සාමාජිකයෙකු ලෙස වාර්ෂිකව රු. 1000 ක මුදල ගෙවා සාමාන්‍ය සාමාජිකයකු ලෙස තව දුරටත් සිටිය හැක. එහෙත් යාවජීව සාමාජිකයකුට හිමි ඡන්ද බලය ඇතුලුව කිසිදු අයිතිවාසිකමක් ඔවුන්ට හිමි නොවේ.

**<u>යෝජනා අංක 10</u>**
10.(3) වගන්තිය ඉවත් කිරීමට යෝජනා කෙරේ.

10.(4), අංකය 10 (3) වශයෙන් සංශෝධනය කෙරේ.

10 (4) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

විහාරස්ථාන දායක සහා සාමාජිකත්වය සඳහා වර්ෂ 05 ක කාලයක් සඳහා රු.250/= ක මුදලක් සාමාජික ගාස්තු වශයෙන් ගෙවිය යුතු අතර, එම සාමාජිකත්වය වර්ෂ 05 කට වරක් මුදල් ගෙවා අලුත් කර ගත යුතුය.

**යෝජනා අංක 11**
17 (1) (අ) වගන්තිය ඉවත් කර මෙසේ සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

17 (1) (අ) යාවජීව සාමාජිකවරුන්ට, සම්මාන සාමාජිකවරුන්ට හා වසර 03 ක් පැරණි සාමාජික සමිතියක අනුමැතිය ලත් නියෝජිතයන් දෙදෙනෙකුටද,

**යෝජනා අංක 12**
17 (1) (ඈ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ

කෙසේ වුවද ප්‍රාදේශිය ශාඛා සමිති/සාමාජික සමිති නියෝජිතයන් සඳහා සාමාජිකත්වය ලබා ගැනීමෙන් වසර 03 කින් අනතුරුව ඡන්ද හිමිකම ලැබෙනු ඇත.

**යෝජනා අංක 13**
17 (2) වගන්තිය ඉවත් කර මෙසේ සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

17 (2) සාමාජික සමිතියකින් සම්මේලනයේ අවස්ථාවන් සඳහා නම් කරන ලද නියෝජිතයන් දෙදෙනාට ඡන්ද හිමිකම ඇති අතර, සාමාජික සමිතිවල ලේකම්වරු විසින් අදාල නම් ලියාපදිංචි කිරීම 8 (1) (ඊ) වගන්තියට අනුව ක්‍රියා කළයුතුය.

**යෝජනා අංක 14**
17 (4) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ

සාමාජික සමිති නියෝජිතයින් නිලවරණය සඳහා නාම යෝජනා ලබා දෙන්නේ නම් අඛන්ඩව එම නියෝජිතයා වසර 03 ක් සම්මේලනයේ නියෝජිතයෙකු ලෙස නම් කර ක්‍රියාකාරීව කටයුතු කර තිබිය යුතුය.

**යෝජනා අංක 15**
20 (1) වගන්තිය මෙසේ සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

අවම වශයෙන් සම්මේලනයේ වසර 10 සාමාජිකත්වය සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ වසර 03 පළපුරුද්ද හෝ සම්මේලනයේ වසර 20 සාමාජිකත්වය

සහ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ වසරක හා විධායක සභාවේ වසර 03 ක්‍රියාකාරී සාමාජිකත්වය සභාපති තනතුර සඳහා ද, නියෝජ්‍ය සභාපති, සමලේකම්වරු සහ භාණ්ඩාගාරික තනතුර සඳහා වසර 05 සාමාජිකත්වය හා කෘත්‍යාධිකාරී මණ්ඩලයේ වසර 02 සාමාජිකත්වය ද, විධායක සභාවේ වසර 03 සාමාජිකත්වය ද අවශ්‍ය වේ. සෙසු නිලධාරින් සඳහා වසර 03 සාමාජිකත්වය හිමිවීම ප්‍රමාණවත් වේ.

එම සියලු නිලධාරීන් මිථ්‍යාආජීවයෙන් වැලකී සිටින සැදැහැවත් සුපිළිපන් බවින් යුතු අයෙකු වීම සහ ප්‍රාදේශිය සභාවක සිට ජනාධිපතිවරණය දක්වා මැතිවරණයකට ඉදිරිපත් වු අයෙකු මෙන්ම, ආසන සංවිධායකවරයෙක් හා පිලිගත් දේශපාලන පක්ෂයක නිලතල දරණ ඕනෑම අයෙකු බෞද්ධ මහා සම්මේලනයේ නිලවරණයට ඉදිරිපත් වීමට පෙර එම නිලතල වලින් වසර 05 කට පෙර ඉවත් වු බව පිලිගත් සාක්ෂි මගින් ඉදිරිපත් කිරිමෙන් පසුව නිලවරණ කමිටුව පිලිගන්නේ නම් පමණක් එකී යාවජීව සාමාජිකයා හට ව්‍යවස්ථානුකූලව නිලතල සඳහා ඉදිරිපත් විය හැකිය. මෙය සමිති සාමාජිකයන්ට ද අදාල වේ.

15 20 (1) වගන්තියේ දෙවන ඡේදයෙහි සඳහන් කොටස ව්‍යවස්ථාවේ නිලධාරින් පත් කර ගැනීමේදී බලාපොරොත්තු වන අර්ථ නිරූපනයක් ලෙස ඇතුලත් වේ.

**<u>යෝජනා අංක 16</u>**

20 (4) වගන්තිය ඉවත් කර 20 (4) (අ) ලෙස සංශෝධනය කිරීමට යෝජනා කෙරේ.

20 (4) (අ) සමිති නියෝජිතවරුන්ටද නිලයන් සඳහා ඉදිරිපත් වීමට හෝ නිල දැරීමට අවකාශ ඇති අතර, අදාල සමිතියට හිමි සාමාජිකත්වය හෝ සමිතිය නියෝජනය කිරීමේ අවසරය අවලංගු වුවහොත් එම නියෝජිතයා සම්මේලනයේ දරන්නා වු නිලය ද අවලංගු වේ.

**<u>යෝජනා අංක 17</u>**

20 (4) (ආ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ

20 (4) (ආ) නිලයන් සඳහා ඉදිරිපත් වන නියෝජිතයාට අදාල සමිතිය 20 (1) වගන්තිය සපුරා තිබිය යුතු අතර අදාල නියෝජිතයාද එම වගන්තියට අනුව සම්මේලනයේ අවස්ථාවන් නියෝජනය කර තම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**<u>යෝජනා අංක 18</u>**
20 (6) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

ප්‍රධාන සභාපති ධුරය නොකඩවා වාර දෙකකට වැඩි කාලයක් යම් සාමාජිකයකු විසින් නොදැරිය යුතුය.

**ව්‍යවස්ථා සංශෝධන කමිටුව**

**<u>යෝජනා අංක 01</u>**
20 (7) (අ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ කෘත්‍යාධිකාරි මණ්ඩලයේ එක් පවුලකින් සිටිය හැකි සාමාජික සංඛ්‍යාව එක් අයෙකුට නොවැඩි විය යුතුය (උපරිම එක් අයෙකි)

''පවුල'' නිර්වචනය කිරීම
බිරිද හෝ ස්වාමියා (කලත්‍රයා), දියණියන් හා පුතුන් සහ ඔවුන්ගේ කලත්‍රයන්

**<u>යෝජනා අංක 02</u>**
20 (7) (ආ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

ජාතික මණ්ඩලයක, විධායක සභාවේ සිටිය හැකි උපරිම සංඛ්‍යාව එක් පවුලකින් එක් අයෙකුට නොවැඩි විය යුතුය.

විධායක සභික - සභාපති, උපසභාපති, ලේකම් හා භාණ්ඩාගාරික
(චෙක්පත් අත්සන් කිරීම එක පවුලක දෙදෙනෙකුගෙන් සිදුවීම වැලැක්වීම)

**<u>යෝජනා අංක 03</u>**
20 (7) (ඇ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමට යෝජනා කෙරේ.

විධායක සභාවේ මණ්ඩල කිහිපයක එක පවුලේ අය සිටිය හැකි උපරිම සංඛ්‍යාව තුන්දෙනෙකුට නොවැඩි විය යුතුය.

එක් ජාතික මණ්ඩලයක - කමිටුවක එක පවුලකින් සාමාජිකයින් හතකට එකක් 7:1 හෝ පහලවකට දෙකක් 15:2 උපරිමව සිටිය හැක.

විධායක සහික සමඟ කමිටු සාමාජික ඇතුළුව 7:1 හෝ 15:2
උදා:- සභාපති + හා කමිටු සාමාජික 1 (කමිටුවේ 7 දෙනයි)
ලේකම් + හා කමිටු සාමාජික 2 (කමිටුවේ 15 නම්)

**වෛද්‍ය රාණි ප්‍රනාන්දු**
සාමාජික අංකය - 11389

## වෙනත් යෝජනා - අංක 01

සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ යාවජීව සාමාජික අංක 13509 දරණ වාද්දුව, ගංගාරාම පාර, අංක 3/3 හි පදිංචි මැස්ටියගේ දොන් ජනක බෝධිනන්ද ගුණතිලක මහතාගේ සාමාජිකත්වය අහෝසි කිරීම

## යෝජනා - අංක 02



සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ වසර 96 ක් භාවිතා කළ පැරණි නිල ලාංඡනය සහ කොඩිය නැවත භාවිතා කිරීම සඳහා යෝජනා කෙරේ.

# විශේෂ දැනුම් දීමයි

104 වන සංවත්සර උත්සවය පෙ.ව.08.50 සිට පෙ.ව. 10.30 දක්වා පැවැත්වේ. ඉන්පසුව වාර්ෂික මහා සභා රැස්වීම පෙ.ව. 11.00 ආරම්භ වේ

සහභාගි විය නොහැකි සාමාජිකයන් සඳහා Zoom තාක්ෂණය ඔස්සේ ද සම්බන්ධ කර ගැනීමට කටයුතු සංවිධානය කරනු ලැබේ.

ඒ අනුව 2023.11.15 වෙනි දිනට පෙර ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය (email address) හෝ Whats App අංකය 076-5611374 අපගේ දුරකතන අංකයට හෝ acbc380@gmail.com යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවීමෙන් පසු අප එවනු ලබන Link එක (සම්බන්ධ විය හැකි මාර්ගය) මගින් Zoom තාක්ෂණය ඔබගේ ස්මාට් දුරකතනයෙන් හෝ පරිඝනකය හරහා සංවත්සර සභා රැස්වීමට සහ වාර්ෂික මහා සභා රැස්වීමට සම්බන්ධ විය හැක.

මේ සම්බන්ධව වැඩි විස්තර සඳහා පහත සඳහන් දුරකතන අංක අමතන්න.

දුරකතන අංක :- +94-11-2691695/076-5611374/071-8645554

**තුෂාර දිලුම් වාහලතන්ත්‍රී ඉෂාන් බුද්ධික එදිරිසූරිය**
**ගරු සමලේකම්වරු**